කාර්යසාධන වාර්තාව - 2024

செயல்திறன் அறிக்கை - 2024

PERFORMANCE REPORT -2024

අමාත්‍ය මණ්ඩල කාර්යාලය - කොළඹ - 01

அமைச்சரவை அலுவலகம் - கொழும்பு 01

OFFICE OF THE CABINET OF MINISTERS - COLOMBO 01

කාර්යසාධන වාර්තාව - 2024

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
කොළඹ - 01

පටුන

අන්තර්ගතය			පිටු අංක
පරිච්ඡේදය 01	-	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	03 - 06
පරිච්ඡේදය 02	-	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	07 - 12
පරිච්ඡේදය 03	-	වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය	13 - 16
පරිච්ඡේදය 04	-	කාර්යසාධන දර්ශක	17
පරිච්ඡේදය 05	-	තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය	18
පරිච්ඡේදය 06	-	මානව සම්පත් පැතිකඩ	19 - 23
පරිච්ඡේදය 07	-	අනුකූලතා වාර්තාව	24 - 30
ඇමුණුම I	-	2024 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාමලේඛනය	31 - 35
ඇමුණුම II	-	එක් එක් අමාත්‍යාංශ විසින් යොමු කරන ලද සංදේශ සංඛ්‍යාව	36 - 38
ඇමුණුම III	-	ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය	39
ඇමුණුම IV	-	රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය	40
ඇමුණුම V	-	විගණකාධිපති වාර්තාව	41 - 45

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජනරජයේ ආණ්ඩුවේ පාලනය, මෙහෙයවීම හා විධානයට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම පිණිස අමාත්‍ය මණ්ඩලයට සහ අමාත්‍ය මණ්ඩල අනුකාරක සහා සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 51 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව ප්‍රකාරව ගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබයි.

1.2 දැක්ම

ජනරජයේ පාලනය මෙහෙයවීම සඳහා විධායකයට සහාය වන වඩාත් විශ්වසනීය රාජ්‍ය ආයතනය වීම.

මෙහෙවර

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති ජනරජයේ පාලනය මෙහෙයවීම පිණිස තීරණ ගැනීමේ ක්‍රියාවලියට අවශ්‍ය සියලුම සහායයන් කාර්යක්ෂම ලෙස ලබා දීම.

අරමුණු

අමාත්‍ය මණ්ඩලය හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සහා විසින් දැනුම්වත් තීරණ ගැනීමට හැකිවන පරිදි එම තීරණ ගැනීමේ ක්‍රියාවලියට පහසුකම් සැලසීම සහ අනලස්ව සහාය වීම.

1.3 ප්‍රධාන කාර්යයන්

- අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීමට අදාළ උපදෙස් අමාත්‍යාංශ වෙත ලබා දීම සහ එම කාර්යයේදී අමාත්‍යාංශ ලේකම්වරුන්ට හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට මඟපෙන්වීම.

- ප්‍රතිපත්ති සම්පාදනය හා ජනරජයේ පාලනය මෙහෙයවීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීමේදී අමාත්‍ය

මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත්, අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පිළිබඳව නිරවුල්ව හා අදාළ සියලු කරුණු පිළිබඳව නිසි අවබෝධයෙන් තීරණ ගැනීමට පහසු වන පරිදි, එම සංදේශ පිළිබඳව නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ අමාත්‍යාවරුන්ගේ නිරීක්ෂණ සඳහා යොමු කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කිරීමෙන් පසුව අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල සංදේශ අදාළ නිරීක්ෂණ සමඟ සලකා බැලීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා වෙත සහ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම.

- අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීමේදී සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී එළඹී තීරණ ඇතුළත් වාර්තා භාෂාත්‍රයෙන් සකස් කිරීම හා එකී වාර්තා අමාත්‍යාවරුන් වෙතත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ වෙනත් බලධරයන් වෙතත් යොමු කිරීම.


- අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම් සඳහා අවශ්‍ය සියලු සහය සේවාවන් සැලසීම.

- අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අදාළ අමාත්‍යාංශ වෙත දැනුම් දීම.

- විශේෂ අවධානය යොමු විය යුතු අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කටයුතු කිරීම.

- ගරු ජනාධිපතිතුමා හෝ අමාත්‍ය මණ්ඩලය විසින් නියම කරනු ලබන අමාත්‍ය මණ්ඩල කටයුතු හා සම්බන්ධ වෙනත් කවර හෝ කාර්යයන් ඉටු කිරීම.

1.4 සංවිධාන සටහන


Secretary to the Cabinet of Ministers
Add. Secretary
Add. Secretary
Add. Secretary
Add. Secretary
Legal Advisor
IA
CA
SAS
SAS
SAS
SAS
SAS
SAS
DD (ICT)
AS
AS
AS
AS
AS
Language Consultant
AD (ICT)
AS
AS
AS
AS
Legal Officer
Language Superintendent
AO
Translators
ICT Officer
Co. Sec
Progress Assistant
HOD
HOD
HOD
HOD
ICT Asst.
ICT Asst.
DO
Tech. Officer (Civil)
Tech. Officer (Electrical)
Librarian
MSO
MSO
MSO
MSO
MSO
MSO
MSO
MSO
MSO
Driver
Receptionist
KKS
KKS
KKS
KKS
KKS
KKS
KKS
KKS
KKS
KKS

1.5 අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු / දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ / දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල - අදාළ නොවේ.

1.6 අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව / පළාත් සභාව යටතේ පවතින ආයතනය / අරමුදල් - අදාළ නොවේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේනම්) - අදාළ නොවේ.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2024 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල රැස්වීම් සම්බන්ධයෙන් වූ කර්තව්‍යයන්

2.1.1 2024 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල රැස්වීම් 50ක් හා අමාත්‍ය මණ්ඩලයේ විශේෂ රැස්වීම් 05ක් පවත්වන ලදී. අමාත්‍ය මණ්ඩලයේ තීරණ අපේක්ෂාවෙන් විවිධ අමාත්‍යාංශවලින් අමාත්‍ය මණ්ඩල සංදේශ (අමාත්‍ය මණ්ඩල සංදේශ සහ සටහන් යන දෙවර්ගයම මින් අදහස් වේ) 2,358ක් 2024 වසර තුළ ඉදිරිපත් කරනු ලැබිණි. 2024 වසර තුළ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාමලේඛනය ඇමුණුම I හි දැක්වේ (2024 වර්ෂය තුළ අවස්ථා කිහිපයක දී අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් වී ඇත). එක් එක් අමාත්‍යාංශය විසින් 2024 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව ඇමුණුම II හි දැක්වේ.

2.1.2 2024 වර්ෂය තුළ ඉදිරිපත් කරනු ලැබූ සංදේශ සම්බන්ධයෙන් අදාළ අමාත්‍යාංශ වෙතින් නිරීක්ෂණ ලබා ගැනීමට කටයුතු කරන ලද අතර, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් එම සංදේශ පිළිබඳ නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම සහ එම යෝජනාවලින් පැනනැඟිය හැකි සංකූලතා ආදිය පිළිබඳ අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයට අවශ්‍ය අවස්ථාවන්හිදී කරුණු ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

2.1.3 අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශවලට අදාළව එළඹී තීරණ ඇතුළත් වාර්තා මෙම කාර්යාලය විසින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන් සකස් කර අමාත්‍යවරුන් වෙතත්, අදාළ තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරී තිබූ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙතත් යොමු කරන ලදී.

වගුව 2:1 - ඉදිරිපත් කරන ලද කාර්යය අනුව අමාත්‍ය මණ්ඩල සංදේශ වර්ගීකරණය - 2024:

කාණ්ඩය	සංදේශ ගණන
ප්‍රතිපත්තිමය කටයුතු	1052
ව්‍යවස්ථා සම්පාදනයට අදාළ කටයුතු	218
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන පරිදි අමාත්‍ය මණ්ඩලය විසින් ඉටු කළ යුතු ආයතනික කටයුතු	287
ප්‍රසම්පාදන කටයුතු සහ රාජ්‍ය වියදම් සම්බන්ධිත කරුණු	588
වාර්ෂික වාර්තා	213
එකතුව	**2358**

2.1.4 අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වීමෙන් අනතුරුව, මහජනතාව විසින් දැනගත යුතු යැයි හඳුනාගනු ලබන සංවර්ධන ව්‍යාපෘති, සුබසාධන වැඩසටහන්, රජයේ ප්‍රසම්පාදන කටයුතු, විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම යනාදී විශේෂ අමාත්‍ය මණ්ඩල තීරණවල සාරාංශ ඇතුළත් වාර්තාවක් එදිනම සකස් කොට එය අමාත්‍ය මණ්ඩලයේ මාධ්‍ය ප්‍රකාශක වශයෙන් කටයුතු කරනු ලබන ගරු අමාත්‍යතුමන් වෙත සහ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීමට කටයුතු කර තිබේ. ඊට අමතරව එම තොරතුරු අමාත්‍ය මණ්ඩල රැස්වීම පැවැත්වූ දිනට පසු දින වන විට අමාත්‍ය මණ්ඩල කාර්යාලයීය වෙබ් අඩවියේ පළ කරන ලදී.

2.2 2024 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවලට අදාළ කටයුතු:

අමාත්‍ය මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරලීම පිණිස නිශ්චිත ක්ෂේත්‍ර හෝ කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පහත සඳහන් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරනු ලැබ ඇති අතර ඒවා 2024 වර්ෂය තුළදී ක්‍රියාත්මක විය.

(අ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

(අ) ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව:

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ආයතන කටයුතුවලට අදාළව පහත සඳහන් බලතල අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇත:

- රජයේ නිලධරයන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම ඇතුළු රජයේ නිලධරයන්ට අදාළ සියලු ප්‍රතිපත්තිමය කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම [55 වැනි ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව].

- දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම, උසස් කිරීම, මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය සහ ඔවුන් සේවයෙන් පහ කිරීම [55 වැනි ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව].

මෙම බලතල ක්‍රියාත්මක කිරීමේදී යෝග්‍යතම තීරණයට එළඹීමට අමාත්‍ය මණ්ඩලයට පහසු වනු පිණිස අමාත්‍යාංශවලින් ඉදිරිපත් කෙරුණු සංදේශ ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ කාර්යභාරය වේ. මෙයට අමතරව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ව්‍යවසායයන් හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි වාර්ෂික කාර්යසාධන වාර්තා හා මූල්‍ය ප්‍රකාශ පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස අනුමැතිය ලබා ගැනීමට අදාළ අමාත්‍ය මණ්ඩල සංදේශ පරීක්ෂා කර ඊට අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේ වගකීම ද ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙත පැවරී ඇත.

2024 වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවති ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය ඇමුණුම III හි දැක්වේ.

දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කිරීම සඳහා වූ සංදේශ මෙම කාර්යාලය වෙත ලද විගස නිර්දේශිත නිලධාරීන් සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගෙන ඇත්ද යන්න හෝ එසේ කිරීමට අදහස් කර ඇත්ද යන්න පිළිබඳව එම නිලධාරීන් අයත් වන සේවාවන්ට අදාළ පත්වීම් බලධරයා වෙතින් සහ පරිපාලන බලධරයා වෙතින් විමර්ශා කැඳවීම සිදු කරනු ලැබේ.

විවිධ අමාත්‍යාංශ වෙතින් 2024 වර්ෂය තුළදී ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ විෂයපථයට අදාළව අමාත්‍ය මණ්ඩල සංදේශ 287ක් ඉදිරිපත් වී තිබූ අතර, එම සංදේශ පිළිබඳව සාකච්ඡා කිරීමට ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් 11 ක් පවත්වා ඇත. එකී අනුකාරක සභාවේ නිර්දේශ ඉන් පසු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පියවර ගෙන තිබේ.

පහත නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ අතර, එම නිලධාරී කමිටුව සභාගී වූ රැස්වීම් 11 ක් අදාළ වසර තුළ දී පැවැත්විණි.

ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ නිලධාරී කමිටුව

i. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
ii. රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ ලේකම්
iii. භාණ්ඩාගාරයේ ලේකම් හෝ ඔහු විසින් නම් කරන ලද භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු
iv. ජනාධිපති ලේකම් විසින් නම් කරනු ලබන ජනාධිපති ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
v. අග්‍රාමාත්‍ය ලේකම් විසින් නම් කරනු ලබන අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු
vi. ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්
vii. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
viii. ආයතන අධ්‍යක්ෂ ජනරාල්
ix. ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

එසේම, අවශ්‍ය අවස්ථාවලදී ඇතැම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශ ලබාගැනීමට ද කටයුතු කරන ලදී. අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අමාත්‍ය මණ්ඩලය විසින් සලකා බලා, ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශ 287 සම්බන්ධයෙන්ම සිය තීරණ ලබා දී ඇති අතර, එකී තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත හා අනෙකුත් අදාළ ආයතන වෙත අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් යොමු කරනු ලැබ ඇත.

2024 වසර තුළ අමාත්‍ය මණ්ඩලය විසින් දෙපාර්තමේන්තු ප්‍රධානීන් අසුළුක් දෙනෙකු (81) පත් කිරීම සම්බන්ධයෙන් තීරණ ගන්නා ලද අතර ඒ සඳහා වූ පත්වීම් ලිපි අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලදී.

මෙම අනුකාරක සභාව 2024.09.21 දින දක්වා ක්‍රියාත්මක විය.

(ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

2024 වර්ෂය තුළ දී රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ රැස්වීම් 09ක් පවත්වන ලදී. 2024 වර්ෂය තුළ ක්‍රියාත්මකව පැවති රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සංයුතිය ඇමුණුම IV හි දැක්වේ.

රාජ්‍ය වියදම් කළමණාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වූ නිලධාරී කමිටුව

i. අග්‍රාමාත්‍ය ලේකම්

ii. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්

iii. මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්

iv. ජනාධිපති අතිරේක ලේකම්වරයෙකු

මෙම අනුකාරක සභාව 2024.09.21 දින දක්වා ක්‍රියාත්මක විය.

2.3 2024 වසර තුළ සිදු කරන ලද විශේෂයෙන් සඳහන් කළ යුතු කාර්යභාරයන්:

2.3.1 අමාත්‍ය මණ්ඩල ලේකම්වරයා ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වන නිලධාරී කමිටුවේ සහ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවට සහාය වන නිලධාරී කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරන ලදී.

2.3.2 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ විධිවිධාන අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාළව ක්‍රියාත්මක කිරීම එම පනත බලාත්මක වීම ආරම්භ වූ 2017-02-03 දින සිටම සිදු කිරීමට පියවර ගන්නා ලද අතර 2024 වර්ෂය තුළදී ද එම පනත යටතේ කටයුතු සිදු කරන ලදී. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා 'නම් කළ නිලධාරී' ලෙසත් මෙම කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකු 'තොරතුරු නිලධාරී' ලෙසත් මෙම වසර තුළදී කටයුතු කරන ලදී. මෙම කාර්යාලයට අදාළ ලේඛන හා සබැඳි තොරතුරුවලට ප්‍රවේශ විය හැකි ආකාරය, ඒ සඳහා අදාළ අයදුම්පත් සහ ආකෘතිපත්‍ර සහ ඒ පිළිබඳ අනෙකුත් තොරතුරු කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කිරීමට ක්‍රියා කරන ලදී. 2024 වර්ෂය තුළ තොරතුරු ඉල්ලීමේ අයදුම්පත් 262ක් මෙම කාර්යාලය වෙත ඉදිරිපත් විය. එයින් ඉල්ලීම් 257ක් සඳහා ප්‍රතිචාර දක්වන ලදී.

2.4 අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යභාරයේ විශේෂත්වය :

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරයේ සුවිශේෂත්වය නිසා බොහෝ අවස්ථාවලදී අනෙකුත් රජයේ ආයතනවල කටයුතු කෙරෙන සාමාන්‍ය ආකාරයෙන් බැහැරව කටයුතු කිරීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට සිදුවේ. විශේෂයෙන්ම අමාත්‍ය මණ්ඩල රැස්වීම් 02ක් අතර කාලපරතරය සතියකට පමණක් සීමා වන බැවින් පහත ආකාරයේ කල් දැමිය නොහැකි කාර්යභාරයන් රැසක් ඉතාම කෙටි කාලයක් තුළ ඉටු කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යමණ්ඩලය වෙත පැවරී ඇත.

- සඳුදා පැවැත්වෙන සතියේ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ වාර්තාව එම සතියේ බ්‍රහස්පතින්දා පෙරවරුව වන විට භාෂාත්‍රයෙන් පිළියෙල කොට අවසන් කිරීම.
- ඊළඟ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමට අදහස් කෙරෙන අමාත්‍ය මණ්ඩල සංදේශවල අන්තර්ගත කරුණු පිළිබඳව අධ්‍යයනය කිරීම.
- එම සංදේශවලට අදාළ අවශ්‍ය අතිරේක තොරතුරු රැස් කිරීම හා එම කරුණු සම්බන්ධයෙන් මීට පෙර අමාත්‍ය මණ්ඩල තීරණ කිසිවක් තිබේ නම් ඒ පිළිබඳ සොයා බැලීම.
- ඇතැම් සංදේශවල සඳහන් යෝජනාවන් ක්‍රියාත්මක කිරීමේදී පැනනැඟිය හැකි ප්‍රතිපත්තිමය හා නෛතික ගැටළු ගැන අධ්‍යයනය කිරීම (අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා හා ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින්).
- එම සංදේශවල අන්තර්ගත කරුණු සම්බන්ධයෙන් අදාළ වන පරිදි ඒ ඒ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් වෙතින් නිරීක්ෂණ ලබා ගැනීම.

අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලට අමතරව ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ සහ රාජ්‍ය වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවේ රැස්වීම්වලට අදාළ වාර්තා පිළියෙල කිරීම හා එම වාර්තා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අදාළ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ බලධාරීන් වෙත යොමු කිරීම ද ඒ ඒ සතිය තුළ සිදු කළ යුතුය.

මෙම සියලු කටයුතු කිරීමේදී එම කරුණු සම්බන්ධයෙන් රහස්‍යභාවය ආරක්ෂා කිරීම නිලධාරීන්ගේ වගකීමක් වන අතර එය ඉහළ මට්ටමින් පවත්වා ගනිමින්, සතියේ දිනවල සාමාන්‍ය රාජකාරී වේලාවන් ඉක්මවා රාත්‍රී කාලයේ ද රාජකාරියේ නිරත වීමටත්, සතිඅන්ත දිනවල හා රජයේ නිවාඩු දිනවල ද සේවයේ යෙදීමටත් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිලධාරීන්ට සිදු විය.

මෙම හේතුව නිසා අමාත්‍ය මණ්ඩල කාර්යාලයට නිලධාරීන් බඳවා ගනු ලැබීමේදී ඉහත සඳහන් අවශ්‍යතාවන්ට ගැලපෙන, විශේෂයෙන් තෝරාගත් කුසලතා සහිත නිලධාරීන් පිරිසක් බඳවා ගැනීමට කටයුතු කරනු ලැබ ඇති අතර 2024 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයේ යෙදුනු නිලධාරීන් පිළිබඳ තොරතුරු 06 වන පරිච්ඡේදයෙහි ඇතුළත් වේ.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉටු කළ යුතු නෛතික කටයුතු සඳහා සහාය වීම පිණිස නීති උපදේශක තනතුරෙහි කටයුතු කරනු ලබන විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්වරියගේ සේවය කොන්ත්‍රාත් පදනම මත තවදුරටත් ලබාගන්නා ලදී.

2.5 අභියෝග හා ඉදිරි ඉලක්ක

ඉහත 1.3හි සඳහන් ප්‍රධාන කාර්යයන් 2025 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව කාර්යක්ෂම හා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
දිනය: 2025-05- 30

ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
අමාත්‍ය මණ්ඩල කාර්යාලය
ලොයිඩ්ස් ගොඩනැගිල්ල
ශ්‍රීමත් බාරෝන් ජයතිලක මාවත
කොළඹ 01.

03 පරිච්ඡේදය

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය 2024.12.31 දිනට

එකිනෙ-යේ

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ය-ෙවෙනිය අවසන් ත්‍රෛමාසය 2024		සටහන	සමස්ත 2024	2023	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්		-	-	
-	ලබාදෙන සේවා	1	-	-	
-	පරිශීලන සංගෝධ සහ ඇඩවා මත බදු	2	-	-	සසඳ-1
-	රාජ්‍යාන්තර ගවිමුදාම් මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් සහ වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	සාමාන්‍යකාර අලුම්බ		181,778,000	171,858,000	සසඳ-3
-	කැප්පාවු		1,429,028	442,183	සසඳ-4
-	අක්ෂිකාරෙට මිලදුම්		4,934,072	5,609,724	සසඳ-5
-	වෙනත් ප්‍රථාන ලෙලව් මිලදුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		188,141,100	177,909,907	
-	මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		188,141,100	177,909,907	
-	සාමාන්‍යකාරයට අදාළ (ඇ)		1,471,438	7,078,335	
	අදාළ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		186,669,661	170,831,571	
	අදළ කළා : වියදම්				
-	ප්‍රතාරවිරහන වියදම්		-	-	
106,300,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	101,497,644	90,102,413	
84,330,000	අනෙකුත් සංගෝධ සහ ගෙවීම්	6	58,959,243	58,150,687	සසඳ-2(ii)
800,000	සභාපතිගේ, ප්‍රධාන සහ මාර්ගවිරති	7	512,239	528,232	
-	අතැඳි වෙනවිති	8	-	-	
100,000	වෙනත් ප්‍රතාරවිරහන වියදම්	9	-	-	
191,530,000	මුළු ප්‍රතාරවිරහන වියදම් (ඊ)		160,969,126	148,781,322	
	මූලධන වියදම්				
15,500,000	මූලධන වත්කම් ප්‍රතාරෝපණය සහ වැඩිදියුණු කිරීම්	10	5,146,224	4,420,018	
19,270,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම	11	19,253,368	13,466,992	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	සසඳ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
1,500,000	තැන්පැවු වර්ධනය	14	749,443	403,306	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
36,270,000	මුළු මූලධන වියදම් (උ)		25,149,035	18,290,315	
	තැන්පතු ගෙවීම්		339,576	261,018	සසඳ-4
	අක්ෂිකාරම් ගෙවීම්		4,183,832	5,786,939	සසඳ-5
	වෙනත් ප්‍රථාන ලෙලව් මිලදුම් ගෙවීම්		-	-	
	ප්‍රථාන ලෙලව් වියදම් (ඌ)		4,523,408	6,547,957	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		190,641,568	173,619,595	
-	දෙසැම්බර් 31 දිනට හේෂය ඒ = (ඉ-එ)		(3,971,907)	(2,788,024)	
	අදිම සැපයුම් ප්‍රතාහාරය ආපසු හේෂය		(3,971,907)	(2,788,024)	සසඳ-7
	දෙසැම්බර් 31 දිනට අදිම හේෂය		-	-	සසඳ-3

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2024 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	2024 රු.	2023 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	175,296,159	113,367,732
කල්බදු ආශ්‍රිතය			8,001,980
මූල්‍ය වත්කම්			
අත්කිකාරම් මිණුම්	ඒසිඒ-5/5(ඒ)	11,975,613	12,725,853
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		187,271,772	134,095,565
කරබ වත්කම් / බැරකම්			
භාණ්ඩාගාරය වෙත කරබ වත්කම්		10,589,929	12,429,671
දේපළ පිරියත හා උපකරණ සංචිතය		175,296,159	113,367,732
කුලී හා වැඩි අත්කිකාරම් සංචිතය	ඒසිඒ-5(ඒ)		
බැරකම් වගකීම්			
කල්බදු ණය වගකීම්			8,001,980
තැන්පතු හිණුම්	ඒසිඒ-4	1,385,684	296,182
අදාළ සේවය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		187,271,772	134,095,565

මිටු අංක 1 සිට 33 දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පනුවලින් ඉදිරිපත් කෙරෙන හිණුම් සහෙරතුරු සහ ඇතුලුම් මිටු අංක 34 සිට 42 දක්වා ඇතුළත් හිණුම් සටහන් වත්කර ද මෙම අවසන් හිණුම්මේඛ අත්සන්කරන ලොටයේ වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් චරඳලාඛ 150 සහ 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය හිණුම් කිරීම්පත්‍රයේ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් හිණුම්මේඛ සඳහන් සංඛ්‍යා, ඊට අදාළ හිණුම් පරිශීලන් සහ අනෙකුත් හිණුම් සහෙරතුරු භාණ්ඩාගාර හිණුම් අංශයේ සමීක්ෂා කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය සාරාංශ සඳහා යටලෙහි අනාවරණ පාලන ක්‍රියාවලියක් විස්තාපනය ඇතුළත් කිරීම සඳහා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ සරලකාලය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම ක්‍රියාවලියේ ඵලදායී බවය පරීක්ෂා කිරීම සියුක්‍රීමට වගීන් වර සහාලෝඛන සියලුකරන බවක් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණකාධිකරණ නිලධාරී	ඒකාබද්ධ කළමනාකරණ නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගිණුම්කරු/
නම :	නම :	අධ්‍යක්ෂ (මූල්‍ය)/ කොමිසරිස් (මූල්‍ය)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2025-02-27	දිනය :	දිනය : 2025/02/27

ඩබ්ලිව්.ඒ.ඩී.ඒ්. ප්‍රනාන්දු
අධිකාරය විගණකාධිපති අදහසේ
ආණ්ඩුකාර විගණකාධිපති
ලෝකයේ කොමිසරිස්මේ
මූල්‍ය විගණන ප්‍රධානියා වෙත
කොළඹ 01.

ඩබ්.ඩී.ඒ්.ඒ්. පෙරේරා
ප්‍රධාන ගණකාධිකාරී
ආණ්ඩුකාර විගණකාධිපති
දෙපාර්තමේන්තුව
කොළඹ 01.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඡේදය-2

2024 මැතිවිරිධි 31 දිනෙනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	රුපියල්	
	2024	2023
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් සමන්විත මුදල් ප්‍රවාහයන්		
මූල්‍ය බදු ලාභය	-	-
ගැනුම්, අවිධිගත, අත්හිටුවන් සහ මිලදීගැනුම්	-	-
ලාභාංශ	-	-
ඉඳහිට සහනාධාර ලැබීම්	-	-
මෙහෙයුම් ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මුදල් ප්‍රවාහය	4,232,340	3,951,797
අලුතින් ලැබීම්	181,778,000	171,858,000
ආන්තරාවරණ ගෙවීම් සඳහා	5,355,108	6,211,728
සෙවණැලි ලැබීම්	1,429,028	442,183
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් සමන්විත මුදල් ප්‍රවාහය (අ)	192,794,476	182,443,708
ආයෝජන : මුදල් වියදම් කිරීම්		
මූල්‍යමය සම්පත්ති සහ අස්පර්ශ්‍ය වියදම්	159,671,274	147,721,675
සහකාරිත්ව සහ සාධ්‍ය ආයෝජන	512,219	528,222
අවසාන වාහන සිටින අත්තනෝමතික ලාභ ලැබීම්	1,457,082	2,490,463
සංවර්ධනයට සිටියන ලද ලැබීම්	1,471,438	7,078,335
ආන්තරාවරණ ගෙවීම්	4,183,832	5,575,679
සෙවණැලි ගෙවීම්	339,576	761,018
අවිනාශ්‍ය ක්‍රියාකාරකම්වල සඳහා වියදම සහිත ලද මුදල් ප්‍රවාහය (ආ)	167,685,441	166,153,393
අවසානය ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල්‍ය මුදල් ප්‍රවාහය (ඇ)=(අ)+(ආ)	25,149,035	16,290,315
සාමාන්‍යය ක්‍රියාකාරිත්වලින් සමන්විත මූල්‍ය ප්‍රවාහයන්		
ණයකරු	-	-
ලාභාංශ	-	-
ස්ථිරාංක ආයෝජනවල ප්‍රතිලාභය සහ සාමාන්‍ය වර්ධනය වෙනස්කම්	-	-
ලාභාංශ ගෙවෙන් ගැනීම්	-	-
අවසාන ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල්‍ය ප්‍රවාහය (ඈ)	-	-
අවිනාශ්‍ය : මුදල් වියදම් කිරීම්		
මූල්‍යමය වියදම්	25,149,035	16,290,315
අවසාන්‍ය ක්‍රියාකාරකම් සඳහා වියදම සහිත ලද මූල මුදල් ප්‍රවාහය (ඉ)	25,149,035	16,290,315
අවසාන්‍ය ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල්‍ය මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	(25,149,035)	(16,290,315)
මෙහෙයුම් සහ අවසාන්‍ය ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල්‍ය මුදල් ප්‍රවාහය (උ)=(අ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල්‍ය ප්‍රවාහයන්		
ලද්දීම් කාල සැලසීම්	-	-
වියදම්ය ණය ලැබීම්	-	-
ලාභාංශයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අවිනාශ්‍ය : මුදල් වියදම් කිරීම්		
ලද්දීම් කාල ආපසු ගෙවීම්	-	-
වියදම්ය කාල ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වියදම සහිත ලද මූල මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් සමන්විත මූල මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.1 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.1.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය : අදාළ නොවේ

වගුව 3:1

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (.රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස

3.1.2 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය (රු.'000 වලින්)

වගුව 3:2

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තක්සේරු වියදම	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	191,000	191,530	160,969	84%
ප්‍රාග්ධන	35,000	36,270	25,149	69%

3.1.3 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන :

වගුව 3:3

රු0.00.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තක්සේරු වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	නැත					

3.1.4 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වගුව 3:4

රු0.00.

වත්කම් ශ්‍රේෂය	ක්ෂේත්‍ර විස්තරය	2024-12-31 දින භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශ්‍රේෂය	2024-12-31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශ්‍රේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස වාර්තා කිරීම

04 පරිච්ඡේදය

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගුව 4:1

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% - 74%
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII පරිච්ඡේදය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩලය වෙත පැවරී ඇති රාජකාරි ඉටු කිරීම සඳහා සහාය වීම.	100%		
අමාත්‍ය මණ්ඩල කටයුතු සම්බන්ධයෙන් අමාත්‍යාංශ සහ අනෙකුත් රජයේ ආයතන වෙත මාර්ගෝපදේශ, උපදෙස් සහ තොරතුරු සැපයීම; 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අනුව පොදු මහජනතාව වෙත තොරතුරු ලබා දීම.	98%		
අමාත්‍ය මණ්ඩල සංදේශ තුළ අන්තර්ගත යෝජනාවන්හි සඳහන් ප්‍රතිපත්ති සහ නෛතික කරුණු පිළිබඳ විශ්ලේෂණය කිරීම.	100%		
කාර්යක්ෂම, සාර්ව සහ ඵලදායී තීරණ ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා සඳහා සහාය වීම.	100%		
අමාත්‍ය මණ්ඩලයට එරෙහිව ගෙන ඇති නෛතික කටයුතුවලදී නීතිපති මඟින් අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීම; විවිධ සංසදයන්හිදී අමාත්‍ය මණ්ඩලය නියෝජනය කිරීම.	100%		
කාර්යසාධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මානව සම්පත් සංවර්ධනය.	100%		
ඉහත සඳහන් කාර්යයන් ඵලදායී සහ කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා කාර්යාලය වෙත භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය.	95%		

- 2019-02-26 දිනැති අංක 19/විවිධ(010) දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව 2019-03-06 දිනෙන් පසු, කිසියම් අමාත්‍යාංශයක් විසින් ඉදිරිපත් කරනු ලබන සංදේශයක් පාදක කර ගනිමින් පුරවැසියන් විසින් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත තොරතුරු ලබා ගැනීම සඳහා ඉල්ලීම් කරන අවස්ථාවන්හිදී එකී අවශ්‍ය තොරතුරු, අදාළ සංදේශය ඉදිරිපත් කරන ලද අමාත්‍යාංශය වෙතින් සෘජුවම ලබා ගැනීම සඳහා මග පෙන්වමින් පහසුකම් සැලසිය යුතු වන අතර, ඒ අනුව එදින සිට එපරිදි කටයුතු කර ඇත.

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සමාජීය, ආර්ථික, දේශපාලනික සංවර්ධනය තුළින් දිළිඳුකම පිටුදකිමින් හා සංවර්ධන ඉලක්ක කරා ගමන් කිරීමේදී සමස්ත පරිසරය ආරක්ෂා කර ගැනීමත් අරමුණු කර ගනිමින් 2015 වර්ෂයේදී තිරසර සංවර්ධන අරමුණු 17ක් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත. එම තිරසර සංවර්ධන අරමුණු එක් එක් විෂය ක්ෂේත්‍රයට විශේෂිත වන ලෙස හඳුන්වා දී ඇති අතර, අදාළ ඉලක්කයන් 2030 වර්ෂයේදී ළඟා කර ගැනීමට අපේක්ෂිතය. මෙම ඉලක්කයන්, විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ බැවින්, අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීම සඳහා උචිත වැඩසටහන් සකස් කිරීම, ඒවා ක්‍රියාවට නැංවීම සහ තිරසර සංවර්ධන අරමුණුවලට අදාළව ප්‍රගතිය සමාලෝචනය කිරීම අදාළ එක් එක් විෂයභාර අමාත්‍යාංශයේ කාර්යයක් වේ.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත පැවරී ඇති කාර්යභාරය සැලකීමේදී, තිරසර සංවර්ධන අරමුණු මෙම කාර්යාලයේ කාර්යයන් හා සෘජුවම සම්බන්ධ කළ නොහැක. රජයේ කටයුතු පාලනය හා මෙහෙයවීම සඳහා වන සියලුම ප්‍රතිපත්තිමය තීරණයන් ලබා ගැනීමට අවශ්‍ය වන සහාය දැක්වීම මෙම කාර්යාලය මඟින් සිදු කරන බැවින්, විවිධ අමාත්‍යාංශ විසින් ප්‍රතිපත්තිමය අනුමැතියන් ලබාගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීමේදී, ඒවායේ අන්තර්ගතය තිරසර සංවර්ධන අරමුණු හා එකඟ ද යන්න සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සිදු කෙරේ.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

6.1 2024-12-31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

වගුව 6:1 - 2024-12-31 දිනට සේවා නියුක්තික වර්ගීකරණය

සේවක වර්ගය	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව				පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
		ස්ථිර පදනම මත	රාජකාරි ඉටුකරන / වැඩ බලන පදනම මත	කොන්ත්‍රාත් පදනම මත	එකතුව		
ජ්‍යෙෂ්ඨ මට්ටම	30	13	03	02	18	12	-
තෘතියික මට්ටම	11	09	-	01	10	01	-
ද්විතියික මට්ටම	47	31	02	-	33	14	-
ප්‍රාථමික මට්ටම	40	30	-	-	30	10	-
එකතුව	128	83	05	03	91	37	-

6.2 2024-12-31 දිනට සිටි කාර්යමණ්ඩලය

වගුව 6:2 - 2024-12-31 දිනට කාර්යමණ්ඩල විස්තරය

	තනතුර	අනුමත සංඛ්‍යාව	තත්‍ය සංඛ්‍යාව			පුරප්පාඩු
			ස්ථිර පදනම	රාජකාරි ඉටුකරන / වැඩ බලන පදනම මත	කොන්ත්‍රාත් පදනම	
ජ්‍යෙෂ්ඨ මට්ටම						
01.	අමාත්‍ය මණ්ඩලයේ ලේකම්	01	01	-	-	-
02.	අතිරේක ලේකම්	04	02	02	-	-
03.	නීති උපදේශක	01	-	-	01	-
04.	ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්	06	03	-	-	03
05.	අභ්‍යන්තර විගණක	01	-	01	-	-
06.	ප්‍රධාන ගණකාධිකාරී	01	01	-	-	-

07.	සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ.)	10	03	-	-	07
08.	සහකාර ලේකම් (ශ්‍රී ලං.ප.සේ. නොවන)	01	01	-	-	-
09.	නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	01	-	-	-	01
10.	සහකාර අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)	02	01	-	-	01
11.	නීති නිලධාරි	01	01	-	-	-
12.	භාෂා උපදේශක	01	-	-	01	-
තෘතීයික මට්ටම						
13.	සම්බන්ධීකරණ ලේකම්	01	-	-	01	-
14.	පරිපාලන නිලධාරි	01	01	-	-	-
15.	භාෂා අධිකාරි	01		-	-	01
16.	භාෂා පරිවර්තක	06	06	-	-	-
17.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි	01	01	-	-	-
18.	ප්‍රගති සහකාර	01	01	-	-	-
ද්විතීයික මට්ටම						
19.	සංවර්ධන නිලධාරි	11	04	-	-	07
20.	තාක්ෂණ නිලධාරි (විදුලි)	01	-	01	-	-
21.	තාක්ෂණ නිලධාරි (සිවිල්)	01	-	01	-	-
22.	පුස්තකාලයාධිපති	01	01	-	-	-
23.	කළමනාකරණ සේවා නිලධාරි	31	24	-	-	07
24.	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	02	02	-	-	-
ප්‍රාථමික මට්ටම						
25.	රියදුරු	16	14	-	-	02
26.	කා.සේ.සේ.	23	16	-	-	07
27.	පිළිගැනීමේ නිලධාරි	01	-	-	-	01
	එකතුව	**128**	**83**	**05**	**03**	**37**

6.3 2024 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවයට අලුතින් එක් වූ සේවක මහත්ම/මහත්මීන්.

2024 වසර තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්යමණ්ඩලය වෙත නිලධාරීන් දොළොස් දෙනෙකු (12) අලුතින් එක් විය.

6.4 විශ්‍රාම ගැනීම් හා සේවය අවසන් කිරීම්

2024 වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ සේවය කරමින් සිටි නිලධරයින් සිව්දෙනෙකු (04) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

6.5 ස්ථාන මාරුවීම්

2024 වසර තුළ නිලධාරීන් පස්දෙනෙකු (05) ස්ථාන මාරුවීම් ලබා අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් වෙනත් සේවා ස්ථානයන්ට ස්ථාන මාරු වී ඇත.

6.6 පුහුණුව හා සංවර්ධනය

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2024 වර්ෂයට අදාළව පිළියෙල කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම අනුව අවසාන කාර්තුවේ දී නිලධාරීන් විසි පස්දෙනෙකු (25) සඳහා පුහුණුවීම් අවස්ථා ලබා දීමට මෙම කාර්යාලයට හැකි විය.

පුහුණු වැඩසටහන් තුළින් ලබා ගන්නා දැනුම, කාර්යාලයේ රාජකාරිමය කටයුතු සඳහා සෘජුවම අදාළ කර ගන්නා අතර, එමඟින් පුද්ගල අභිප්‍රේරණය හා ආකල්ප වර්ධනය ද සිදුවේ. ඒ අනුව, එම පුහුණු වැඩසටහන්, කාර්යාල කටයුතුවල කාර්යක්ෂමතාව හා ඵලදායිතාව කෙරෙහි සෘජුව හා වක්‍රව දායක වේ. 2024 වර්ෂය මුලදී සැලසුම් කරන ලද මානව සම්පත් සංවර්ධන සැලැස්ම පරිදි සහ නව පුහුණු පාඨමාලා සඳහා කාර්යමණ්ඩල සාමාජිකයින් යොමු කිරීමට හැකිවීම ආයතනික මට්ටමින් ලද ජයග්‍රහණයකි.

වගුව 6:3 - **2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පවත්වා ඇති පුහුණු වැඩසටහන්**

	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද නිලධර සංඛ්‍යාව	වැඩසටහන තුළ එක් නිලධාරියෙක් පුහුණුව ලද කාලය	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහන් ස්වාභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
1	දූෂණ විරෝධී පුහුණුකරුවන් පත් කිරීම හා දූෂණ විරෝධී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	01	දින 03	00		දේශීය	සුපිළිපන් රාජ්‍ය සේවයක් නිර්මාණය කිරීම
2	General Conduct and Disiplinary Procedure	01	දින 05	00		දේශීය	විනය කාර්ය පටිපාටියට අදාළ ක්‍රියාවලිය පිළිබඳ දැනුම ලබා ගැනීම
3	Board of Survay Losses & Write-Off	01	දින 02	13,000.00		දේශීය	භාණ්ඩ සමීක්ෂණය හා හානි පාඩු පොත්වලින් කපා හැරීම ආදී කරුණු පිළිබඳ අවබෝධය ලැබීම
4	Public Service Disciplinary Procedure	01	දින 02	18,000.00	-	දේශීය	රාජ්‍ය ආයතන තුළ විනය කළමනාකරණ කිරීම පිළිබඳ දැනුම ලබා ගැනීම
5	Stores Management and Purchasing proceedure	01	දින 02	13,000.00		දේශීය	ගබඩා පාලනය හා භාණ්ඩ හා සේවා මිලදී ගැනීම පිළිබඳ අවබෝධය ලබා ගැනීම
6	ලේඛන අපහරණය පිළිබඳ පුහුණු වැඩමුළුව	05	පැය 07	35,000.00		දේශීය	කාර්යාලයීය ලේඛන අපහරණය කිරීම පිළිබඳ අවබෝධය ලබා ගැනීම
7	විනය කළමනාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	03	දින 05	75,000.00	-	දේශීය	ආයතනයේ නිලධාරීන්ගේ විනය කටයුතු කළමනාකරණය පිළිබඳ අවබෝධය ලබා ගැනීම
8	පුස්තකාලයාධිපතිවරුන් මුහුණ දෙන සංරක්ෂණ ගැටළු හා ඒ සඳහා පිළියම් යෙදීම සම්බන්ධ වැඩමුළුව	01	පැය 04	00	-	දේශීය	පුස්කාලයේ පොත්පත් හා ලේඛන සංරක්ෂණ ගැටළු හා ඒ සඳහා පිළියම් යෙදීම සම්බන්ධ විධික්‍රම පිළිබඳ අවබෝධය ලබා ගැනීම
9	Awareness programe for the Public Sector on Responcibility of Public Officers for an Efficient, People Friendly, Open & Accountable Government	01	පැය : 3.5	00	-	දේශීය	Aware of on Responcibility of Public Officers for an Efficient, People Friendly, Open & Accountable Government

	පුහුණු වැඩසටහන	පුහුණු කරන ලද නිලධර සංඛ්‍යාව	වැඩසටහන තුළ එක් නිලධාරියෙක් පුහුණුව ලද කාලය	සමස්ත ආයෝජනය (රු.)		වැඩසටහන් ස්වභාවය (දේශීය / විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
10	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	01	දින 12	00	-	දේශීය	වෘත්තීයමය ආකල්ප වර්ධනය වීම
11	සුපිළිපන් නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන	01	දින 03	00	-	දේශීය	සුපිළිපන් දේශයක් නිර්මාණ කිරීම සඳහා නිලධාරීන් පුහුණු කිරීම
12	Awareness Session on Government Web Developer Standards and Proceedure	02	පැය : 7	00	-	දේශීය	Aware of Government Web Developer Standards and Proceedure
13	Information Session on JICA Short/Long Term Training Programme (KCCP/LTTP and JDS)	01	පැය : 2	00	-	දේශීය	Aware of JICA Short/Long Term Training Programme (KCCP/LTTP and JDS)
14	සේවා ව්‍යවස්ථාවේ දක්වා ඇති පරිදි සේවා අවශ්‍යතාව මත පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කිරීම	01	වසර 01	200,000.00	-	දේශීය	සේවා ව්‍යවස්ථාවේ අවශ්‍යතාවන් සම්පූර්ණ කිරීම
15	ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන	01	දින 27	00		දේශීය	වෘත්තීයමය ආකල්ප සංවර්ධනය වීම
16	National Artificial Intelligence (AI) Stratergy	03	පැය : 7	00		දේශීය	කෘතිම බුද්ධිය පිලිබඳ පුහුණුවක් ලබා ගැනීම

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

වගුව 7:1

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ ගිණුම් / නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	2024-02-28 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	2024-02-28 දිනට පෙර ඉදිරිපත් කළ යුතුය		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම	අදාළ නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත්	අදාළ නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම .	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	වෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර	අනුකූල වේ		

	පවත්වාගෙන යාම			
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014-05-11 දිනැති අංක 17/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිත කිරීමේදී ගණකාධිකාරිවරුන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2021 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලසුම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) උපවගන්තිය ප්‍රකාරව සියලුම	අනුකූල වේ		

	අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2021 අනුව අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල නොවේ	වාර්තාව ප්‍රමාද වීම සහ වාර්තාව දෝෂ සහිත වීම නිසා නැවත ගණනය කිරීමට තීරණය කිරීම	සමීක්ෂණ කටයුතු කඩිනමින් නිම කිරීමට උපදෙස් ලබා දීම හා පුහුණුව ලත් නිලධාරීන් සමීක්ෂණ මණ්ඩල සඳහා පත්කිරීම
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	වාර්තාව ප්‍රමාද වීම සහ වාර්තාව දෝෂ සහිත වීම නිසා නැවත ගණනය කිරීමට තීරණය කිරීම	සමීක්ෂණ කටයුතු කඩිනමින් නිම කිරීමට උපදෙස් ලබා දීම හා පුහුණුව ලත් නිලධාරීන් සමීක්ෂණ මණ්ඩල සඳහා

				පත්කිරීම
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	වාර්තාව ප්‍රමාද වීම සහ වාර්තාව දෝෂ සහිත වීම නිසා නැවත ගණනය කිරීමට තීරණය කිරීම	
9	වාහන කළමනාකරණය කිරීම			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස්කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් නිසි පරිදි යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016-12-29 දිනැති අංක 2016/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	බැංකු ගිණුම් කළමනාකරණය			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර, සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		

10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	නිහඬිටි ණය ශේෂ පිළිබඳ කාලවිශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන නිහඬිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු කැන්පක් ගිණුම**			
13.1	කල්ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමා ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අදාළ නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාළ නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්යමණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්යමණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017-09-20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කර තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රසාදය / චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2018 හා 05/2018(1) දරන රාජ්‍ය පරිපාලන කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ රාජකාරි පුරවැසියන් සමඟ සෘජු ලෙස සම්බන්ධ නොවීම	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ රාජකාරි පුරවැසියන් සමඟ සෘජු ලෙස සම්බන්ධ නොවීම	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018-01-24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කර ගෙන මානව සම්පත් සැලැස්ම සකස් කොට තිබේ	අනුකූල වේ		

19.2	කාර්යමණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	ජාතික අයවැය වක්‍රලේඛ 01/2024 මඟින් පුහුණු අවස්ථා සීමා කිරීම	සැලසුම් කළ මානව සම්පත් සැලැස්ම සංශෝධන කර කාර්යාලයට අදාළ වන අත්‍යාවශ්‍ය පුහුණු අවස්ථාවන් ලබා දීමට කටයුතු කිරීම
19.3	ඉහත සඳහන් වක්‍රලේඛයේ ඇමුණුම් 01හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර නොතිබිණි	රා.පරි. ව. 02/2018(1) මඟින් වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම තවදුරටත් අවශ්‍ය නොවන බව දක්වා ඇත.
19.4	ඉහත වක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ඇමුණුම I

2024-01-01 දින සිට 2024-02-02 දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාම ලේඛනය

01	ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා	ජනාධිපති ආරක්ෂක අමාත්‍ය මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍ය තාක්ෂණ අමාත්‍ය ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය
02	ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා	අග්‍රාමාත්‍ය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය
03	ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය
04	ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිතුමිය	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය වාරිමාර්ග අමාත්‍ය
05	ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා	ධීවර අමාත්‍ය
06	ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා	අධ්‍යාපන අමාත්‍ය
07	ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය ජනමාධ්‍ය අමාත්‍ය
08	ගරු(ආචාර්ය) කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා	පරිසර අමාත්‍ය
09	ගරු මහින්ද අමරවීර මැතිතුමා	කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය
10	ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය
11	ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා	සංචාරක හා ඉඩම් අමාත්‍ය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය
12	ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා	සෞඛ්‍ය අමාත්‍ය කර්මාන්ත අමාත්‍ය
13	ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
14	ගරු අලි සබ්රි මැතිතුමා	විදේශ කටයුතු අමාත්‍ය
15	ගරු විදුර වික්‍රමනායක මැතිතුමා	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
16	ගරු කංචන විජේසේකර මැතිතුමා	විදුලිබල හා බලශක්ති අමාත්‍ය
17	ගරු මනූෂ නානායක්කාර මැතිතුමා	කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය
18	ගරු ටිරාන් අලස් මැතිතුමා	මහජන ආරක්ෂක අමාත්‍ය
19	ගරු නලීන් ප්‍රනාන්දු මැතිතුමා	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය
20	ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා	ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

2024-02-03 දින සිට 2024-07-28 දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාම ලේඛනය

01	ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා	ජනාධිපති ආරක්ෂක අමාත්‍ය මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍ය තාක්ෂණ අමාත්‍ය ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය පරිසර අමාත්‍ය
02	ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා	අග්‍රාමාත්‍ය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය
03	ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය
04	ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිනුමිය	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය වාරිමාර්ග අමාත්‍ය
05	ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා	ධීවර අමාත්‍ය
06	ගරු(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා	අධ්‍යාපන අමාත්‍ය
07	ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය ජනමාධ්‍ය අමාත්‍ය
08	ගරු මහින්ද අමරවීර මැතිතුමා	කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය
09	ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය
10	ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා	සංචාරක හා ඉඩම් අමාත්‍ය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය
11	ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා	සෞඛ්‍ය අමාත්‍ය කර්මාන්ත අමාත්‍ය
12	ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
13	ගරු අලි සබ්‍රි මැතිතුමා	විදේශ කටයුතු අමාත්‍ය
14	ගරු විදුර වික්‍රමනායක මැතිතුමා	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
15	ගරු කංචන විජේසේකර මැතිතුමා	විදුලිබල හා බලශක්ති අමාත්‍ය
16	ගරු මනූෂ නානායක්කාර මැතිතුමා	කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය
17	ගරු ටිරාන් අලස් මැතිතුමා	මහජන ආරක්ෂක අමාත්‍ය
18	ගරු නලීන් ප්‍රනාන්දු මැතිතුමා	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය
19	ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා	ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

2024-07-29 දින සිට 2024-09-20 දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාම ලේඛනය

01	ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා	ජනාධිපති ආරක්ෂක අමාත්‍ය මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍ය තාක්ෂණ අමාත්‍ය ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය පරිසර අමාත්‍ය
02	ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා	අග්‍රාමාත්‍ය රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය
03	ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය
04	ගරු පවිත්‍රා දේවි වන්නිආරච්චි මැතිනුමිය	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍ය වාරිමාර්ග අමාත්‍ය
05	ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා	ධීවර අමාත්‍ය
06	ගරු(ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා	අධ්‍යාපන අමාත්‍ය
07	ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය ජනමාධ්‍ය අමාත්‍ය
08	ගරු මහින්ද අමරවීර මැතිතුමා	කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය
09	ගරු හරීන් ප්‍රනාන්දු මැතිතුමා	සංචාරක හා ඉඩම් අමාත්‍ය ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය
10	ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මැතිතුමා	සෞඛ්‍ය අමාත්‍ය කර්මාන්ත අමාත්‍ය
11	ගරු ප්‍රසන්න රණතුංග මැතිතුමා	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍ය
12	ගරු අලි සබ්‍රි මැතිතුමා	විදේශ කටයුතු අමාත්‍ය අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය
13	ගරු විදුර වික්‍රමනායක මැතිතුමා	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
14	ගරු කංචන විජේසේකර මැතිතුමා	විදුලිබල හා බලශක්ති අමාත්‍ය
15	ගරු මනුෂ නානායක්කාර මැතිතුමා	කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය
16	ගරු ටිරාන් අලස් මැතිතුමා	මහජන ආරක්ෂක අමාත්‍ය
17	ගරු නලින් ප්‍රනාන්දු මැතිතුමා	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය
18	ගරු ජීවන් තොණ්ඩමන් මැතිතුමා	ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍ය

2024-09-24 දින සිට 2024-11-28 දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාම ලේඛනය

01	ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා	ජනාධිපති ආරක්ෂක අමාත්‍ය මුදල්, ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය බලශක්ති අමාත්‍ය කෘෂිකර්ම, වාරිමාර්ග, පශුසම්පත්, ඉඩම්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍ය
02	ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මැතිතුමිය	අග්‍රාමාත්‍ය අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා, සමූපකාර සංවර්ධන සහ කර්මාන්ත අමාත්‍ය ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය සෞඛ්‍ය අමාත්‍ය
	ගරු විජිත හේරත් මැතිතුමා	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍ය ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන්සේවා අමාත්‍ය මහජන ආරක්ෂක අමාත්‍ය පරිසර, වනජීවී, වන සම්පත්, ජල සම්පාදන, වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍ය

2024-11-29 දින සිට 2024-12-31 දක්වා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලද අමාත්‍යවරුන්ගේ නාම ලේඛනය

01	ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා	ජනාධිපති ආරක්ෂක අමාත්‍ය මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය ඩිජිටල් ආර්ථික අමාත්‍ය
02	ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මැතිතුමිය	අග්‍රාමාත්‍ය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය
03	ගරු විජිත හේරත් මැතිතුමා	විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය
04	ගරු කේ.ඩී. ලාල් කාන්ත මැතිතුමා	කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය
05	ගරු බිමල් රත්නායක මැතිතුමා	ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය
06	ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා	කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍ය
07	ගරු රාමලිංගම් චන්ද්‍රසේකර් මැතිතුමා	ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍ය
08	ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා	කම්කරු අමාත්‍ය
09	ගරු සමන්ත විද්‍යාරත්න මැතිතුමා	වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍ය
10	ගරු අනුර කරුණාතිලක මැතිතුමා	නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍ය
11	ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා	සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍ය
12	ගරු (ආචාර්ය) ඒ.එච්.එම්.එච්.අබයරත්න මැතිතුමා	රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍ය
13	ගරු වසන්ත සමරසිංහ මැතිතුමා	වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍ය
14	ගරු (නීතිඥ) හර්ෂණ නානායක්කාර මැතිතුමා	අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය
15	ගරු සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මැතිතුමිය	කාන්තා සහ ළමා කටයුතු අමාත්‍ය
16	ගරු (ආචාර්ය) උපාලි පන්නිලගේ මැතිතුමා	ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍ය
17	ගරු කේ.එම්. ආනන්ද විජේපාල මැතිතුමා	මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය
18	ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මැතිතුමා	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍ය
19	ගරු සුනිල් කුමාර ගමගේ මැතිතුමා	තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍ය
20	ගරු(ආචාර්ය) ක්‍රිෂාන්ත අබේසේන මැතිතුමා	විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය
21	ගරු(ඉංජිනේරු) කුමාර ජයකොඩි මැතිතුමා	බලශක්ති අමාත්‍ය
22	ගරු(වෛද්‍ය) දමිත්‍රක පටබැඳි මැතිතුමා	පරිසර අමාත්‍ය

ඇමුණුම II

එක් එක් අමාත්‍යාංශ විසින් යොමු කරන ලද සංදේශ සංඛ්‍යාව
2024-01-01 සිට 2024-09-21 දක්වා

අනු අංකය	අමාත්‍යාංශය	සංදේශ සංඛ්‍යාව
01.	ගරු ජනාධිපතිතුමා	143
02.	ගරු අග්‍රාමාත්‍යතුමා	26
03.	ආරක්ෂක අමාත්‍යාංශය	49
04.	මුදල් ආර්ථික ,ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය	242
05.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	79
06.	ධීවර අමාත්‍යාංශය	35
07.	අධ්‍යාපන අමාත්‍යාංශය	161
08.	ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය	106
09.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	18
10.	සෞඛ්‍ය අමාත්‍යාංශය	82
11.	ජලසම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය	43
12.	කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	101
13.	වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය	15
14.	අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය	97
15.	සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය	35
16.	කර්මාන්ත අමාත්‍යාංශය	31
17.	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	98
18.	විදේශ කටයුතු අමාත්‍යාංශය	38
19.	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	43
20.	විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය	116
21.	පරිසර අමාත්‍යාංශය	19
22.	වාරිමාර්ග අමාත්‍යාංශය	48
23.	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	24
24.	කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය	29
25.	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	28
26.	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය	24
27.	වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය	103
28.	කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය	19
29.	තාක්ෂණ අමාත්‍යාංශය	19
30.	ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය	61
31.	අමාත්‍ය මණ්ඩලයේ ලේකම්	20
	එකතුව	**1952**

එක් එක් අමාත්‍යාංශ විසින් යොමු කරන ලද සංදේශ සංඛ්‍යාව

2024-09-24 සිට 2024-11-14 දක්වා

අනු අංකය	අමාත්‍යාංශය	සංදේශ සංඛ්‍යාව
01.	ගරු ජනාධිපතිතුමා	06
02.	ගරු අග්‍රාමාත්‍යතුමා	02
03.	ආරක්ෂක අමාත්‍යාංශය	02
04.	මුදල්, ආර්ථික සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍ය	16
05	විදුලිබල අමාත්‍යාංශය	02
06	කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය	06
07.	අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය	08
08.	අධ්‍යාපන, විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	06
09.	කාන්තා, ළමා හා තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යාංශය	02
10.	වෙළෙඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා, සමූපකාර සංවර්ධන, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය	02
11.	සෞඛ්‍ය අමාත්‍යාංශය	04
12.	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු, ජාතික ඒකාබද්ධතා, සමාජ ආරක්ෂණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය	08
13.	ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය	17
14.	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	08
15.	විදේශ කටයුතු අමාත්‍යාංශය	08
16.	පරිසර, වනජීවී, වන සම්පත්, ජලසම්පාදන, වැවිලි සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය	06
17.	ග්‍රාමීය හා නාගරික සංවර්ධන, නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය	02
	එකතුව	**105**

එක් එක් අමාත්‍යාංශ විසින් යොමු කරන ලද සංදේශ සංඛ්‍යාව
2024-11-18 සිට 2024-12-31 දක්වා

අනු අංකය	අමාත්‍යාංශය	සංදේශ සංඛ්‍යාව
01.	ගරු ජනාධිපතිතුමා	13
02.	ගරු අග්‍රාමාත්‍යතුමා	09
03.	ආරක්ෂක අමාත්‍යාංශය	04
04.	මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය	46
05.	ඩිජිටල් ආර්ථික අමාත්‍යාංශය	01
06.	අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය	26
07.	විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යාංශය	11
08.	කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය	16
09.	ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය	28
10.	කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය	09
11.	ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය	05
12.	කම්කරු අමාත්‍යාංශය	01
13.	වැවිලි සහ චතු යටිතල පහසුකම් අමාත්‍යාංශය	07
14.	නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශය	20
15.	සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	09
16.	රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	26
17.	වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා හා සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය	07
18.	අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය	16
19.	කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය	02
20.	ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශය	02
21.	මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය	05
22.	බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	04
23.	යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය	01
24.	විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය	02
25.	විදුලිබල අමාත්‍යාංශය	23
26.	පරිසර අමාත්‍යාංශය	08
	එකතුව	**301**

ඇමුණුම III

2024-01-01 දින සිට 2024-09-21 දක්වා ආයතන කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

අනු අංකය	නම	තනතුර
01	ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අග්‍රාමාත්‍ය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා පළාත් පාලන අමාත්‍ය	සභාපති
02	ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා ධීවර අමාත්‍ය	සාමාජික
03	ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අධ්‍යාපන අමාත්‍ය	සාමාජික
04	ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය, ජනමාධ්‍ය අමාත්‍ය	සාමාජික
05	ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය	සාමාජික
06	ගරු විරාන් අලස් මැතිතුමා මහජන ආරක්ෂක අමාත්‍ය	සාමාජික

ඇමුණුම IV

2024-01-01 දින සිට 2024-09-21 දක්වා රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව

අනු අංකය	නම	තනතුර
01	ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපති, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය	සභාපති
02	ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා, අග්‍රාමාත්‍ය, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය	සාමාජික
03	ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍ය	සාමාජික
04	ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍ය, ජනමාධ්‍ය අමාත්‍ය	සාමාජික
05	ගරු (ආචාර්ය) කෙහෙළිය රඹුක්වැල්ල මැතිතුමා සෞඛ්‍ය අමාත්‍ය	සාමාජික
06	ගරු මහින්ද අමරවීර මැතිතුමා කෘෂිකර්ම අමාත්‍ය	සාමාජික
07	ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා සංචාරක හා ඉඩම් අමාත්‍ය	සාමාජික
08	ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමා වැවිලි කර්මාන්ත අමාත්‍ය, කර්මාන්ත අමාත්‍ය	සාමාජික
09	ගරු කංචන විජේසේකර මැතිතුමා විදුලිබල හා බලශක්ති අමාත්‍ය	සාමාජික
10	ගරු නලීන් ප්‍රනාන්දු මැතිතුමා වෙළෙඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍ය	සාමාජික

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/A/CO/02/24/02 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2025 මැයි 29 දින

ප්‍රධාන ගණන් දීමේ නිලධාරී,
අමාත්‍ය මණ්ඩල කාර්යාලය

ශීර්ෂය 005 - අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 005 - අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී ඉදිරිපත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අමාත්‍ය මණ්ඩල කාර්යාලය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ දුර්වලතා

විදේශ ගමන් වියදම් හා දීමනා ලෙස නිලධාරීන් තිදෙනෙකුට ගෙවීම්කර තිබූ රු.395,443 ක වියදම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ඒසීඒ 2(i) – වැඩසටහන් අනුව වියදම් ප්‍රකාශනයේ වැය විෂයය 005-1-1-1102 යටතේ දැක්විය යුතු වුවද එම වියදම වැය විෂයය 005-1-1-2401 යටතේ කාර්යය මණ්ඩල පුහුණු ලෙස දක්වා තිබුණි.

1.6.2 මූල්‍ය නොවන වත්කම්

ජංගම නොවන වත්කම් තුළ ඇතුළත් මෝටර් වාහන වටිනාකම රු.148,367,080 ක් ලෙස තක්සේරු කර තිබුණද සිගාස් වත්කම් ලේඛන යාවත්කාලීන නොකර රු.116,765,580ක් ලෙස දැක්වීමෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් වටිනාකම රු.31,601,500 කින් අඩුවෙන් දක්වා තිබුණි.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 127(5) ප්‍රකාරව ඇස්තමේන්තු ප්‍රතිපාදිත මුදල හා වියදම් අතර සැලකිය යුතු වෙනස්කම් පරීක්ෂණයට භාජනය වන බවට වගබලා ගැනීමට විධිවිධාන යෙදිය යුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස මු.රෙ.66 මඟින් වැය විෂයයන් 03 ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය සියයට 12 සිට සියයට 14 දක්වා පරාසයක වැඩිකර ගෙන තිබුණු අතර තවත් වැය විෂයයන් 03ක වාර්ෂික අයවැය ප්‍රතිපාදනය සියයට 14 සිට සියයට 69 දක්වා පරාසයකින් අඩුකරගෙන තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව හැකිතාක් දුරට සම්පූර්ණයෙන් නිවැරදිව, සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා විශේෂයෙන් වගබලා ගත යුතු වුවත්, ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 21 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.98,330,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.36,460,485 ක් හෙවත් සියයට 17 සිට සියයට 100 දක්වාත් තවත් ප්‍රාග්ධන වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.17,000,000 ක ශුද්ධ ප්‍රතිපාදන වලින් රු.11,104,333 ක් හෙවත් සියයට 17 සිට සියයට 85 දක්වා සැලකිය යුතු ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි.

(ඇ) වැය විෂයය අංක 005-1-1-0-1403 යටතේ 2023 වර්ෂයේදී රු.15,000,000 ක ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර 2024 වර්ෂයේදී එය රු.24,000,000 ක් දක්වා එනම් සියයට 60 කින් වැඩිකර තිබුණද වර්ෂය අවසානයේදී ඉන් රු.6,049,681 ක් එනම් සියයට 25 ක් ඉතිරිවී තිබුණි. ඒ අනුව, ඵලදායී පාලන උපක්‍රමයක් ලෙස සැලසුම්කරණය යොදා ගෙන නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2018 මාර්තු 01 දිනැති අංක 01/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ (අ) ඡේදයට අනුව ආයතනයට රු.156,340ක් වටිනා බජාජ් වර්ගයේ යතුරුපැදිය භාවිතයෙන් ඉවත් කර වසර තුනකට අධික කාලයක් ගතවී තිබුණද එය අපහරණය කිරීමට හෝ අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව

2024 වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද කාර්යසාධන වාර්තාවේ කෙටුම්පත අනුව විශේෂිත දර්ශකය යටතේ කාර්යයසාධනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා මානව සම්පත් සංවර්ධනය සඳහා නිමවුම සියයට 100 ක් ලෙස සඳහන් කර තිබුණද කාර්ය මණ්ඩල පුහුණු වීම් සඳහා වෙන් කර තිබූ රු.1,500,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සත්‍ය වියදම රු.749,443 වූ අතර එය ඇස්තමේන්තු කළ මුදලින් සියයට 50 ක් විය. ඒ අනුව නිමවුම සියයට 100 ක් ලෙස සඳහන් කර තිබූ අතර ක්‍රියාකාරී සැලැස්ම අනුව මානව සම්පත්

ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාකාරකම් 7 ක් හඳුනාගෙන ක්‍රියාත්මක කර තිබුණි. වර්ෂය අවසානයේ එම ක්‍රියාකාරකම් මැනීම තුලින් සත්‍ය නිමවුම ගණනය කල යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

4.1.2 ප්‍රසම්පාදන සැලැස්ම

සැලසුම් කළ කාලරාමුව තුළ ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකර නොතිබුණු අතර එසේ ඉටුකර ගැනීමට අපහසු ප්‍රසම්පාදන කාර්යයන් හඳුනා ගෙන සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළයුතු වුවත් 2024 වර්ෂය තුළ ප්‍රසම්පාදන සැලැස්ම යාවත්කාලීන කර නොතිබුණි.

4.1.3 ප්‍රසම්පාදන කාර්යයන්

වටිනාකම රු.1,295,050 ක් වූ අභ්‍යන්තර දුරකථන පද්ධතියක් සපයා ගැනීම සඳහා ආයතන 09කින් ලංසු කැඳවා තිබුණු අතර එක් ආයතනයක් පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණි. ඒ සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයෙන් තාක්ෂණික දැනුම සහිත නිලධාරියෙකුගේ සහාය ලබා ගැනීමට ලිපියක් යොමු කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (අ) ඡේදය අනුව කාර්යයසාධන සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණු අතර අදාල ආයතනය සමඟ එකඟ වූ ගිවිසුම් අනුවද ඇණවුම් ඉදිරිපත් කර දින 14 ක් ඇතුළත ආයතනය විසින් කාර්යයසාධන ඇපකරයක් ඉදිරිපත් කළයුතු බව දක්වා තිබුණද ඒ අනුවද කටයුතු කර නොතිබුණි.

4.1.4 කළමණාකරණ දුර්වලතා

අමාත්‍ය මණ්ඩල කාර්යාලය පවත්වාගෙන යන ලොයිඩ්ස් ගොඩනැගිල්ල අති විශේෂ ගැසට් පත්‍රයක් මඟින් 2021 නොවැම්බර් 15 දින අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ භුක්තියට පවරා ගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය දක්වාම ගොඩනැගිල්ලේ අයිතිය පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොතිබුණි.

5. මානව සම්පත් කළමණාකරණය

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාව 128ක් වූ අතර එයින් 37 ක් පුරප්පාඩු වී පැවතුණි. ඒ අනුව ආයතනයේ සමස්ත කාර්යය මණ්ඩලයෙන් සියයට 29 ක් පුරප්පාඩු වී පැවති අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු සියයට 40 ක් විය. එය ආයතනයේ කාර්යයසාධනයට සෘජු බලපෑමක් විය හැකි බව විගණනයේදී නිරීක්ෂණය විය.

ඒ.ජී.ඒ. හෙල්මිණි
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති (වැ.බ.) වෙනුවට